**බුලත්සිංහල ප්‍රාදේශීය සභාව - 2024**
**-------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන** පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.32 ඡේදය ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ආයෝජන ආදායම ලෙස රු.154,314 ක් අඩු කළ යුතු වුවත්, රු.599,667 ක් අඩු කර තිබුණු අතර අතිරික්තය ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණු පුනරාවර්තන නොවන වියදම් සඳහා ලැබීම් රු.88,432,487 ක් ගලපා තිබීම විගණනයේදී පිළිගත නොහැකි විය. | 2024 වර්ෂයේ ලද පොලී ප්‍රමාණය සඳහා පමණක් ගැලපුම් කර ඇති බව හා 2024 වර්ෂයේදී මාර්ග හා ගොඩනැගිලි සඳහා ලැබුණු ප්‍රාග්ධන ආධාර ප්‍රමාණය දක්වා ඇති බව. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය රු.26,465 ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වර්ෂයේ ලද පොලිය පමණක් වර්ෂයේ ආදායම සඳහා හඳුනාගෙන ඇති බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) සේවක ඇප තැන්පත් රු.163,742 ක් සහ සේවක ඇප ආයෝජන රු.163,742 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණ අතර හෙළිදරව් කිරීමක් පමණක් සිදු කර තිබුණි. | 2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම-. |

### 1.6.3 අයිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 වර්ෂයට පෙර සිට පැවත එන නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකිව ඉතිරිවූ ගනුදෙනුවල එකතුව වූ රු.116,297 ක අවිනිශ්චිත ගිණුමෙහි ශේෂය කිසිදු හඳුනා ගැනීමකින් තොරව කපා හැර තිබුණි. | හඳුනාගත නොහැකි බැර ශේෂය කපා හැරීම සඳහා අනුමැතිය ලබාගෙන ඇති බව. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය කපා හැරීමට පෙර අනුමැතිය ලබාගත යුතුය. |

**1.7 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති , රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1987 අක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (ඉ) වගන්තිය | ඉඩම් අනු බෙදුම් සඳහා අනුමැතිය ලබාදීම සභාවේ බලය ලත් නිලධාරියා වන සභාපතිවරයා විසින් සිදු කළ යුතු වුවත් 1992 වර්ෂයේදී උපසභාපතිවරයා විසින් පනතේ වගන්තියට පටහැනිව ගුරුගේ දේපළ සමාගම විසින් විකිණීම සඳහා ඉදිරිපත් කරන ලද පිඹුරු අංක 278 දරන ඉඩමේ අනුබෙදුම් අනුමත කර තිබුණි. එහෙත් මේ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියා මාර්ගයක් සභාව විසින් සිදු කර නොතිබුණි. | අනුබෙදුම් පිඹුර අනුමත කිරීම අධිකරණය මගින් අනුමත කර ඇති බව. | ප්‍රාදේශිය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ජේදය | සභාව සතු වාහන 09 ක ඉන්ධන දහන පරික්ෂාව චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සිදු කර නොතිබුණි. | ධාවනය ඉතාම අඩු මට්ටමේ පවතින වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව යාවත්කාලීන කර නොමැති බව. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2022 ජනවාරි 22 දිනැති අංක 2264/18 දරන අති විශේෂ ගැසට් පත්‍රය | සභාව සතු දෙහිගහවෙල ආදාහනාගාරය සහ පොලේගොඩ ආදාහනාගාරය සඳහා ගැසට් පත්‍රය ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉල්ලුම්පත් යොමු කර ඇති බව. | යොමුගත ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) 1984 අංක 44 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතින් සංශෝධිත 8(එ)4(2) වගන්තිය | අනුකූලතා සහතිකය ලබා නොගෙන ගොඩනැගිල්ලක් භාවිතයට යොදා ගැනීම දඬුවම් ලැබිය හැකි වරදක් වුවද පනතට පටහැනිව අනුකූලතා සහතිකය ලබා නොගෙන තෙබුලන්ද ස්ප්‍රින්ග් පානීය ජලය බෝතල් කිරීමේ ආයතනය පවත්වා තිබුණ ද ඒ සම්බන්ධයෙන් සභාව කිසිඳු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | අයදුම්පත්‍රය අනුව සැලැස්මේ යෝජිත භාවිතය වාණිජ භාවිතය ලෙස දක්වා ඇති නිසා කර්මාන්තයක් සඳහා අනුමැතියට අවසර ලබා දී නොමැති බව. | යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.15,171,795 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.2,103,503 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2024 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,985,493 | 6,060,070 | 5,555,199 | 2,017,831 | 4,502,502 | 3,399,060 | 3,905,678 | 1,658,843 |
| (ii) | කුලී | 6,304,000 | 3,341,515 | 4,756,697 | 153,714 | 5,431,000 | 2,702,889 | 5,021,657 | 129,404 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,785,500 | 864,539 | 1,018,839 | - | 1,005,500 | 572,843 | 888,338 | 37,500 |
| (iv) | වෙනත් ආදායම් | 51,851,500 | - | 50,888,610 | - | 11,056,500 | - | 9,560,738 | - |
| | | 70,926,493 | 10,266,124 | 62,219,345 | 2,171,545 | 21,995,502 | 6,674,792 | 19,376,411 | 1,825,747 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට සමස්ථ හිඟ ආදායම රු.1,825,747 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.757,136 හෙවත් සියයට 41 ක් අය කර ගෙන නොතිබුණි. | හිඟ ආදායම අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) වරිපනම්** | | |
| (i) සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් හිඟය රු.1,414,328 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.655,140හෙවත් සියයට 46 ක් අයකර නොතිබුණි. | 2025 වර්ෂයේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (ii) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බිල් කිරීම රු.4,489,075ක් වූ අතර වර්ෂය අවසානයේ රු.1,285,807 ක් හෙවත් සියයට 29 ක් අයකර ගෙන නොතිබුණි. | 2025 වර්ෂයේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) වරිපනම් පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වරිපනම් හිමියන් 1,403 දෙනෙකුගෙන් වර්ෂ 01ත් 03 ත් අතර වරිපනම් හිඟය රු.1,040,730 ක් ද, වරිපනම් හිමියන් 287 දෙනෙකුගෙන් වර්ෂ 03ත් 05 | -එම- | -එම- |

| | | |
|---|---|---|
| ත් අතර වරිපනම් හිඟය රු.323,247 ක් ද, වරිපනම් හිමියන් 247 දෙනෙකුගෙන් වර්ෂ 05 ත් 10 ත් අතර වරිපනම් හිඟය රු.396,794 ක් ද, වරිපනම් හිමියන් 168 දෙනෙකුගෙන් වර්ෂ 10 ට වැඩි වරිපනම් හිඟය රු.180,175 ක් ද විය. | | |

**(ඈ) කුලී**

| | | |
|---|---|---|
| සභාව සතු මහල් දෙකකින් සමන්විත කඩ කාමර ගොඩනැගිල්ලේ උඩු මහලේ කඩ කාමර 02 ක් හා බිම් මහලේ කඩ කාමරයක් භාවිතා කිරීමකින් තොරව පැවතුණි. | මෙම කඩකාමර සඳහා ලංසු කැඳවීම් සිදු කර බදු දීමට කටයුතු කරන බව. | නිෂ්කාර්යව පවතින කඩකාමර ප්‍රයෝජනයට ගත යුතුය |

**(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.10,700,000 ක් හා මුද්දර ගාස්තු රු.27,500,000 ක් විය. | 2025 වර්ෂයේදී මුද්දර ගාස්තු ආදායම ලැබී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ** අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2024 වර්ෂයේ පරිත්‍යාගයක් ලෙස ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් ලැබී තිබුණු ජල බවුසරයේ වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි. | 2025 වර්ෂ අවසාන ගිණුමට ගිණුම්ගත කරන බව. | සියළු ස්ථාවර වත්කම් ලේඛනගත කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) 2021 නොවැම්බර් 16 දින සභාව සහ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) සමඟ ඇති කර ගත් ගිවිසුම ප්‍රකාරව ඇගල්ඔය බහුකාර්ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල වසර 30 ක කාලයක් සඳහා ගාස්තු රහිතව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට ලබා දී තිබුණි. ගිවිසුමේ 08 කොන්දේසිය අනුව වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා පාඨමාලා ගාස්තු අය කරනු ලබන්නේ නම් පමණක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ශුද්ධ ලාභයෙන් සියයට 25 ක් සභාවට දිය යුතු වුවත් 2023 සහ 2024 වර්ෂයේ පාඨමාලා ගාස්තු ලෙස පිළිවෙලින් රු.539,000 ක් හා රු.2,266,450 ක් අයකර තිබුණද ශුද්ධ ලාභයෙන් සභාවට අයවිය යුතු සියයට 25 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අය කර ගෙන නොතිබුණි. | 2023, 2024 වර්ෂවල සභාවට අය කර ගතයුතු ගාස්තු අයකර ගැනීම සඳහා කටයුතු කරන බව. | ගිවිසුම් ප්‍රකාරව ශුද්ධ ලාභයෙන් සියයට 25 ක් අයකර ගත යුතුය. |
| (ඇ) 2019 නොවැම්බර් 25 දින බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත ඇගල්ඔය බහුකාර්ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ භුක්තිය පමණක් භාරදී තිබූ අතර 2024 වර්ෂය අවසාන වන විටත් එහි හිමිකම ලබාගෙන නොතිබුණි. | අයිතිය ප්‍රාදේශීය ලේකම් සතු වන බැවින් එය සභා සතු ඉඩමක් ලෙස ගිණුම්ගත කිරීමට | අයිතිය පවරා ගෙන දේපල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| ඒ අනුව අදාල ගොඩනැගිල්ලේ හා ඉඩමේ වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ ස්ථාවර වත්කම් ලෙස හඳුනා ගැනීමට සභාවට නොහැකි වී තිබුණි. | හැකියාවක් නොමැති බව. | |
| (ඇ) 1992 වර්ෂයේ ගුරුගේ දේපල වෙළඳාම් සමාගම විසින් කැබලි කර විකිණීම සඳහා ඉදිරිපත් කරන ලද අංක 278 දරන ඉඩමේ අනුබෙදුම් අනුමත කිරීමේදී රූඩ් 03 පර්චස් 21.1 ක් විශාල ඉඩම් කොටස් 09 ක් සභාවේ ක්‍රීඩාපිටිය සංවර්ධනය සඳහා ඉල්ලා තිබූ අතර , මෙම ඉඩම් කොටස් සභාව විසින් පවරා නොගැනීම හේතුවෙන් 2012 වර්ෂයේදී සභාවට විරුද්ධව නඩු පවරා , එම නඩු තීන්දුව මත 2022 වර්ෂයේදී රු.7,839,998 ක මුදලක් ගුරුගේ දේපල වෙළඳාම් සමාගමට ගෙවීමට සිදු වී තිබුණ ද මෙම අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් කවුරුන්ද යන්න නිශ්චය කිරීමට මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව පරීක්ෂණ සිදු කර මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව අය කරගෙන නොතිබුණි. | අලාභයට වගකිවයුතු නිලධාරීන්ගෙන් මු.රෙ. 104(1) ප්‍රකාරව කටයුතු කර මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | වගකිවයුතු නිලධාරීන් නිශ්චය කර අලාභය අය කළ යුතුය. |
| (ඉ) පළාත් පාලන කොමසාරිස්ගේ 2020 ජුනි 26 දිනැති අංක ජීඑල්ඩී/01/05/පී22/2020 දරන ලිපිය මගින් උක්ත ඉඩම් අනුබෙදුම අනුමත කිරීමේදී විධිමත් පරිපාටිය අනුගමනය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ජේදයේ 13.1 වගන්තිය ප්‍රකාරව මූලික විමර්ශනයක් සිදු කර මසක් ඇතුළත වාර්තාව යොමු කිරීමට ත්‍රී පුද්ගල කමිටුවක් විමර්ශනය සඳහා පත් කර තිබුණද 2024 දෙසැම්බර් 31 දක්වාම පරීක්ෂණය සිදු කර වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | පරීක්ෂණ කටයුතු පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන බව. | විමර්ශන වාර්තාව කඩිනමින් ඉදිරිපත් කළ යුතුය. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වගන්තිය ප්‍රකාරව සියළු වැසිකිළි හා වැසිකිළි වලවල් නිසි කාල සීමාව තුළදී විධිමත් ලෙස පවිත්‍ර කිරීම් හා හිස් කිරීම් සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතු වුවත් බල ප්‍රදේශය තුල මළ අපද්‍රව්‍ය බැහැර කිරිම සඳහා වර්ෂ 03 ක කාලයක සිට ගලිරථ සේවාවක් පවත්වා නොතිබුණි. | 2025 වර්ෂයේදී ගලි එක්රැස්කර ගැනීමේ ටැංකියක් සකස් කිරීම මගින් මෙම කාර්යය සිදු කිරීමට සැලසුම් කර ඇති බව. | මල අපද්‍රව්‍යය බැහැර කිරීම සඳහා ගලි රථ සේවා පවත්වාගෙන යා යුතුය. |

**3.3** **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ට්‍රැක්ටර් රථ 03 ක් ධාවනය තත්ත්වයේ නොපවතින අතර එම ට්‍රැක්ටර් රථ 03 අළුත්වැඩියා කර ධාවනයට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කමිටුව විසින් ලබා දෙන නිර්දේශයන් සලකා බලා වෙන්දේසි කිරීම හෝ අළුත්වැඩියාව සඳහා යොමු කිරීමට යෝජිත බව. | තක්සේරු කමිටු නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |

**3.4** **වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2016 පෙබරවාරි 19 දිනැති අංක 01/2016 දරන බස්නාහිර පළාත් පාලන ලේකම්ගේ පාලන චක්‍රලේඛයේ 1.1.1 ඡේදය ප්‍රකාරව ආයතනය භාරයේ ඇති සියළු වාහන ආයතනයේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානවන විටත් වාහන 03 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශය විෂය භාර නිලධාරි විසින් සභාව වෙත පවරාදීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතින බව. | සියලු වාහන ආයතනයේ නමට පවරා ගත යුතුය. |
| (ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය හා 1946 අංක 57 දරන පොදු සුසාන භූමි හා පෞද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනතේ 03 ජේදය ප්‍රකාරව නිසි බලධාරියා වන ප්‍රාදේශීය සභාව විසින් සභා බල ප්‍රදේශය තුල පවතින සුසානභූමි සභාව වෙත පවරා ගත යුතු වුවත් සුසානභූමි 33 ක් සභාව වෙත පවරාගෙන නොතිබුණි. | සුසාන භූමි පවරා ගැනීමේ ඉදිරි කටයුතු සිදු කරන බව. | බල ප්‍රදේශයේ පවතින සුසාන භූමි ප්‍රාදේශීය සභාව වෙත පවරාගත යුතුය. |
| (ඇ) 2023 වර්ෂයේ එකතුව රු.2,496,276 ක් වැය කර සංවර්ධනය කරන ලද බුලත්සිංහල ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව වෙත පවරාගෙන නොතිබුණි. | දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | ක්‍රීඩාංගනය සභාව වෙත පවරාගත යුතුය. |
| (ඇ) ඇගල්ඔය බහුකාර්ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල තුල පැවති ශ්‍රවනාගාරයේ වරකට ප්‍රේක්ෂකයන් 450 ත් 500 ත් අතර ප්‍රමාණයක් අසුන් ගැනීමට හැකි අතර එම ශ්‍රවනාගාරය 2019 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතුණි. | ශ්‍රවනාගාරයට අවශ්‍ය වායු සමීකරණ හා ආසන පහසුකම් ලබා දී නොමැති බැවින් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී ඇති බව. | අවශ්‍ය පහසුකම් සපුරාගෙන ශ්‍රවනාගාරය භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. 5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2001 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල නිලධාරින් 04 දෙනෙකුගෙන් සභාවට අයවිය යුතු රු.220,840 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරි සැලැස්මේ අයිතම 20 ක ඇස්තමේන්තු මුදල සංශෝධනය කර ප්‍රගතිය ඉදිරිපත් කර තිබුණද ඒ සඳහා සංශෝධිත ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී එසේ නොවීමට වගබලා ගැනීමට සටහන් කර ගත් බව. | සංශෝධිත ඇස්තමේන්තු පිළියෙල කර අනුමත කරවා ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගතිය පරීක්ෂාවේදී ඇස්තමේන්තු පිරිවැය රු.7,904,000 ක් වූ ක්‍රියාකාරකම් 14 ක ප්‍රගතිය සියයට 0 ක් විය. | සභාවේ සේවකයන් යොදවා ඇතැම් කාර්යයන් ඉටු කිරීම , මැතිවරණ කාල සීමාවන් දෙකක් එළඹීම මත එම කාර්යය ඉටු කිරීමට නොහැකි වීම ආදි හේතු මේ සඳහා බලපා ඇති බව. | ක්‍රියාකාරි සැලැස්මට අනුව කාර්යයන් ඉටු කළ යුතුය. |
| (ඇ) | ඇස්තමේන්තු පිරිවැය එකතුව රු.3,375,000 ක් වූ ක්‍රියාකාරකම් 13 ක ප්‍රගතිය සියයට 20 ට වඩා අඩු ප්‍රතිශතයක් විය. | අඩු මුදලක් වැය වීම, පරිත්‍යාගශීලීන්ගේ සහාය ලැබීම හා අළුත්වැඩියාවන් හි අවශ්‍යතාවයක් නොවූ බැවින් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. | තාත්විකව අයවැය ඇස්තමේන්තු පිළියෙල කරවාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන සැලැස්ම තුල ක්‍රියාකාරකම් 24 ක් යටතේ විගණන අරමුණු සඳහන් කර තිබුණද සැලැස්ම තුල ඇතුලත්ව තිබූ ප්‍රසම්පාදනයන්, බදු ගාස්තු අයකිරීම්, සැලසුම් අනුමත කිරීම, සංවර්ධන ව්‍යාපෘති , පුරවැසි ප්‍රඥප්තිය, පරිසර බලපත්‍ර ලබාදීම ආදිය පිළිබඳව ප්‍රමාණවත් විගණනයක් සිදු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී අභ්‍යන්තර විගණන වාර්තා 04 ක් නිකුත් කර ඇති බව. | අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ප්‍රමාණවත් විගණනයක් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

## 4.3 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 30 ක් සඳහා එකතුව රු.9,857,000 ක් වූ ඇස්තමේන්තුගත මුදලින් කිසිදු මුදලක් ප්‍රවර්තන වර්ෂයේදී වැය කර නොතිබුණි. | ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු දක්වා ඇති බව. | අයවැය පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 54 ක් සඳහා එකතුව රු.18,066,225 ක් වූ ඇස්තමේන්තුගත මුදලින් රු.5,887,776 ක් පමණක් වැය කර තිබුණු හෙයින් ඇස්තමේන්තුගත මුදලින් සියයට 50 කට සමාන ප්‍රමාණයක් භාවිතා කර නොතිබුණි. | -එම- | -එම- |